# වාර්ෂික වාර්තාව

# 2017

## බුද්ධශාසන අරමුදල

අංක 135
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07

දුරකථන - 0112303293
විද්‍යුත් තැපෑල - bsfund@mbs.gov.lk
වෙබ් අඩවිය - www.mbs.gov.lk/si/com-akeeba/buddhasasana-fund

# පටුන


| | පිටු අංකය |
|---|---|
| **01. බුද්ධශාසන අරමුදල** | |
| 1.1 දැක්ම | 1 |
| 1.2 මෙහෙවර | 1 |
| 1.3 අරමුණු | 1 |
| 1.4 කාර්යභාරය | 1 |
| 1.5 නෛතික රාමුව | 2 |
| **02. සංවිධාන ව්‍යුහය** | 3 |
| **03. කාර්ය මණ්ඩලය** | 3 |
| **04. අරමුදලේ කාර්ය සාධනය** | |
| 4.1 සාමණේර ආයතන පවත්වානෙ යෑම සඳහා මූල්‍යාධාර ලබාදීම | 4-5 |
| 4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීම | 6-7 |
| 4.3 දුෂ්කර විහරස්ථාන වල සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම | 7 |
| 4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය | 8 |
| 4.5 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන | 9-10 |
| 4.6 වයස්ගතව පැවිදි වූ භික්ෂුන් වහන්සේලාට ප්‍රායෝගිකව පුහුණුව ලබා දීම | 10-11 |
| **05. ඉදිරි ඉලක්ක** | 11 |
| **06. මූල්‍ය කළමණාකරණය** | |
| 6.1 ආදායම් වියදම් ගිණුම | 12-13 |
| 6.2 ශේෂ පිරික්සුම | 14-15 |
| 6.3 ශේෂ පත්‍රය | 16 |
| 6.4 විගණකාධිපති වාර්තාව | 17-22 |

# 01. බුද්ධශාසන අරමුදල

## 1.1 දැක්ම

බොදු පිළිවෙත් රකින, සාරධර්ම සපිරි ගුණගරුක දැහැමි සමාජයක් බිහිකිරීම.

## 1.2 මෙහෙවර

සම්බුදු ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සාමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයන්හි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධශාසනයේ ස්ථිර පැවැත්ම වෙනුවෙන් කටයුතු සිදු කිරීම.

## 1.3 අරමුණු

I. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සඳහා සුදුසු වැඩ සටහන් සිදු කිරීම.
II. බුද්ධශාසනය පෝෂණය කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.


## 1.4 අරමුදලේ කාර්යභාරය

1. සාමණේරයන් වහන්සේලා 5 නමකට වඩා සාමණේර අධ්‍යාපනය ලබා දෙන සාමණේර ආයතන සඳහා මාසික මූල්‍යාධාර පිරිනැමීම.
2. සාමණේර ආයතනවල සාමණේරයන් වහන්සේලාගේ දහම් දැනුම හා වත් පිළිවෙත් පිළිබඳ වාර්ෂික ඇගයීම.
3. දිවයින පුරා අඩු පහසුකම් සහිත විහාරස්ථානයන්හි භෞතික අවශ්‍යතා සපුරාලීම.
4. සම්බුද්ධත්ව ජයන්ති සාමණේර කැපකරු යෝජනා ක්‍රමය
5. භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
6. වැඩිහිටි වියේදී පැවිදි බිමට ඇතුළත්වූ සහ තරුණ ස්වාමීන්වහන්සේලා සඳහා පැවිදි ප්‍රතිපදාවට අයත් වත්පිළිවෙත්, දහම් දැනුම ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම

## 1.5 අරමුදල පිහිටා ඇති නෛතික රාමුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය වන්නේ "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙහි හා 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියළුම ආගම් වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය" යන්න දැක්වේ.

එකී කාර්යභාරයට අනුව 1990 අංක 35 දරණ පනතකින් බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම හා සම්පාදනය කිරීම සඳහා බුද්ධශාසන අරමුදල ලෙස මෙම අරමුදල පිහිටුවා ඇති අතර බුද්ධශාසනය ආරක්ෂා කිරීමෙහි සහ පෝෂණය කිරීමෙහි නිරතව සිටින ආයතන කළමණාකරණයෙහිලා සහාය වීමද අරමුදලේ කාර්ය කරගෙන යාමට අනුශාංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියාවන් සහ දේවල් කිරීම සඳහා බුද්ධශාසන අරමුදල කටයුතු කළයුතු වන බව එම පනතින් නියම කර ඇත.




ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1990 අංක 35 දරන
බුද්ධ ශාසන අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

## 02. සංවිධාන ව්‍යුහය




## 03. කාර්යය මණ්ඩලය

1990 අංක 35 දරණ බුද්ධශාසන අරමුදල් පනතේ 7 (ඊ) හා 14 වැනි වගන්ති යටතේ පාලක මණ්ඩලය විසින් පනවනු ලබන නීතිවල සඳහන් පරිදි අරමුදලේ ප්‍රධාන විධායකයා ලෙස පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන ලේකම් වරයෙකු සිටිය යුතු අතර එම ලේකම්වරයා ගණන් දීමේ නිලධාරියාද වන අතර හැකි සෑම විටම බුද්ධශාසන අමාත්‍යාංශයට අනුයුක්ත රජයේ මාණ්ඩලික නිලධාරීයෙකු අතරින් පත් කරගත යුතු බව දක්වා ඇත.

මේ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු තම නිත්‍ය රාජකාරියට අමතරව මෙම ලේකම් තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලැබේ. එමෙන්ම විශ්‍රාමික ගණකාධිකාරීවරියක අරමුදලේ ගණකාධිකාරී ලෙස සේවය කරනු ලැබේ.

# 04. අරමුදලේ කාර්ය සාධනය

## 4.1 සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබාදීම

ගිහි ජීවිතය අතහැර පැවිදි ජීවිතයට ඇතුලත් වන දරුවා කෙටි කාලයකින් පිරිවෙන් අධ්‍යාපනය වෙත යොමු කෙරේ. අතීතයේ පැවති ක්‍රමය වූයේ කුල දරුවෙකු වසර දෙක තුනක් විහාරස්ථානයක සිටිමින් පැවිදි ජීවිතය හා බණ දහම් පිළිබඳ අවබෝධය ලබා ගනිමින් සිය කැමැත්තෙන්ම පැවිදි ජීවිතයට ඇතුළු වීමයි. නමුත් වර්තමානයේ පැවිදි ජීවිතයට ප්‍රවේශ වන කුල දරුවන්ට සසුන්ගත වීමට පෙර පැවිදි ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඇති අවස්ථා අඩුය.

මෙම අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් බුද්ධශාසන අරමුදල පිහිටු වීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන හඳුනාගත හැකිවේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂූත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂු ජීවිතය පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත් පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වී තිබේ. දසධම්ම සූත්‍රයෙන් නිරූපිත සම්පූර්ණ භික්ෂූන් වහන්සේ නමක් සමාජයට දායාද කිරීම, භික්ෂු ජීවිතය බෞද්ධ පිළිවෙත් අනුව සකස් වූ ජීවිතයක් බව අවබෝධ කර දීම, භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර වෙනස හා භික්ෂූත්වයේ උත්තරීතර භාවය අවබෝධ කරවීම, වෙනත් කෙනෙකුට බරක් නොවී භික්ෂු ජීවිතය ගත කළ යුතු ආකාරය උගැන්වීම සාමණේර අධ්‍යාපනයෙන් සිදු කරනු ලැබේ.

<u>ආධාර ලැබීමට තිබිය යුතු අවශ්‍යතා</u>


i. දහම් පාසල හැරුණු විට වෙනත් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන නොයනු ලබන විහාරස්ථානයක් විය යුතුය.
ii. තුන් බෝධිය තිබිය යුතුය.
iii. අධ්‍යාපනය ලබන සාමණේර හිමිවරුන් නේවාසිකව වැඩ විසිය යුතුය.
iv. නේවාසිකව වැඩ විසීම සඳහා අවශ්‍ය ලැගුම් ගෙවල්, ජලය, විදුලිය, වැසිකිළි ආදි මූලික අවශ්‍යතා තිබිය යුතුය.
v. උදැසන හා දවල් දානය ප්‍රමාණවත් පරිදි ලැබෙන දායක පිරිස් සහිත විහාරස්ථානයක් විය යුතුය.
vi. කුඩා සාමණේර හිමිවරුන් පුහුණු කරවීමට උගත්, සිල්වත් උපසපන් උපාධ්‍යායන් වහන්සේ නමක් සිටිය යුතුය.

## 2017 වසරේ මූල්‍යාධාර ලබා දුන් ආයතන

| අනු අංක | ආයතන (නම/ලිපිනය) | ආයතනයේ සිටින සාමණේර හිමිවරු ගණන |
|---|---|---|
| 1 | කළුතර ඉන්ද්‍රජෝති සාමණේර ආයතනය | 2 |
| 2 | ගාල්ල සිරි සුදස්ස සාමණේර ආයතනය | 13 |
| 3 | ගුන්නැපාන ධම්මපාල සාමණේර ආයතනය | 8 |
| 4 | පල්ලේපොල ශ්‍රී ශාරිපුත්ත සාමණේර ආයතනය | 3 |
| 5 | තල්දෙන මිහිඳු සාමණේර ආයතනය | 7 |
| 6 | ගාල්ල විද්‍යාදීප සාමණේර ආයතනය | 2 |
| 7 | මහනුවර සිරි ධම්මරතන සාමණේර ආයතනය | 15 |
| 8 | කටුගස්තොට සුධම්මානන්ද සාමණේර ආයතනය | 18 |
| 9 | අඹකොටේ මහා මහින්ද සාමණේර ආයතනය | 6 |
| 10 | දඹුල්ල ශ්‍රී ජිනරතන සාමණේර ආයතනය | 13 |
| 11 | කොටපොල සාරානන්ද සාමණේර ආයතනය | 6 |
| 12 | අඹගස්වැව විද්‍යාවංශ සාමණේර ආයතනය | 11 |
| 13 | අමුණුගොඩ සිරිපැරකුම්බා සාමණේර ආයතනය | 5 |
| 14 | තංගල්ල සිරි අරියවංශ සාමණේර ආයතනය | 8 |
| 15 | ඇඹුල්ලපුර සම්බුද්ධාලෝක සාමණේර ආයතනය | 7 |
| | **එකතුව** | **124** |

මෙම වසරේදී දිවයිනේ විවිධ ප්‍රදේශවල වෙසෙන සාමණේර හිමිවරු 124 දෙනෙකු සඳහා රුපියල් 1365000 මූල්‍යාධාර ලබා දීම සිදු කර ඇත.








## 4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීමේ වැඩසටහන

බුද්ධශාසන අරමුදල පිහිටු වීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන පැහැදිලිව හඳුනාගත හැකි වේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂුත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂූන් වහන්සේගේ ජීවිතය පිළිබඳව යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත්පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වේ.

මෙකී අරමුණු ඔස්සේ පුරුදු පුහුණු වූ සාමණේර හිමිවරුන්ගේ දැනුම හා ආකල්ප පිළිබඳ පරීක්ෂා කර බැලීමක් මෙහිදී සිදු කෙරේ. ඒ අනුව පුහුණුව ප්‍රමාණවත්ව ලැබීමෙන් පසු සෑම වසරක් අවසානයේ දී බුද්ධශාසන අරමුදල විසින් පවත්වනු ලබන වර්ෂ අවසාන විභාගයට සාමණේර භික්ෂූන් වහන්සේලාට පෙනී සිටිය හැකි වේ. මෙම ඇගයීමේ දී ලිඛිත පරීක්ෂණයක් මෙන්ම ප්‍රායෝගික හැකියාව පිළිබඳව පරීක්ෂණයක් ද නායක ස්වාමීන්වහන්සේලා ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. මෙම පරීක්ෂණයෙන් විශිෂ්ඨ හා අධිශ්‍රේණියේ සාමාර්ථ ලබා ගන්නා සාමණේරයන් වහන්සේලාට විශේෂ ඇගයීමක් බුද්ධශාසන අරමුදල මගින් සිදු කෙරේ.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

i. ලියාපදිංචි කර ඇති සාමණේර ආයතන වලින් විභාගය සඳහා අයදුම් පත්‍ර කැඳවීම
ii. විභාග කටයුතු සංවිධානය කිරීම
iii. විභාගය පැවැත්වීම
iv. ශිෂ්‍යත්ව ලබා දීම

**2017 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණය පිළිබඳ තොරතුරු**

| | |
|---|---|
| ❖ පරීක්ෂණය පැවැත්වූ ස්ථානය | කැළණිය,පැලියගොඩ, විද්‍යාලංකාර පිරිවෙන |
| ❖ පැවැත්වූ දිනය හා වේලාව | 2017.12. 16 (පෙ.ව 9.00 - ප.ව 3.00) |
| ❖ පරීක්ෂණයට පෙනී සිටි ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | 45 |
| ❖ වැය කළ මුදල | රු754,304/= |

## 4.3 දුෂ්කර විහාරස්ථාන වල සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම

දිවයින පුරා පිහිටි විහාරස්ථාන අතුරින් මූලික පහසුකම් සම්පූර්ණ නොවූ විහාරස්ථාන රාශියක් දැකිය හැකිය. එබැවින් අවම පහසුකම් සම්පූර්ණ නොවූ එම විහාරස්ථානවල වැඩ වසන භික්ෂූන් වහන්සේලාට සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් දියුණු කර ගැනීම සඳහා අවස්ථාව සලසාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

වර්ෂයකට එක් දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තෝරාගෙන එම බල ප්‍රදේශය සම්බන්ධව ප්‍රමුඛතා ලේඛනය අනුව සැකසු වාර්තාවක් අනුව විහාරස්ථාන තෝරාගැනීම හා ඍජුව බුද්ධශාසන අරමුදල වෙත කෙරෙන ඉල්ලීම් ද ප්‍රාදේශීය ලේකම්/ බෞද්ධ කටයුතු සමායෝජකගේ නිර්දේශය සහිතව ලබාගෙන පාලක මණ්ඩල අනුමැතියෙන් මූල්‍යාධාර ලබාදීම සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂය සඳහා සැලසුම් කළ ව්‍යාපෘතියක් වුවද ක්‍රියාත්මක කර නැත.

## 4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය

සම්බුද්ධත්ව ජයන්ති වර්ෂයට අදාළව හා 2010 වර්ෂයේ සිට පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහා විශේෂ සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමයක් හා 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහාද මෙම ව්‍යාපෘතිය අදාළ වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ඉහත කාලය තුළ පැවිදි බිමට පත් සාමණේරයන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු සඳහා හෝ වෙනත් ප්‍රත්‍ය අවශ්‍යතා සඳහා මූල්‍යමය දායකත්වයක් ලබා දීම තුළින් උන්වහන්සේලාගේ ශාසන පැවැත්මට සහයක් ලබාදීම අපේක්ෂා කෙරේ.

මෙම සාමණේර ශිෂ්‍යාධාර කැපකරු ක්‍රමයට තෝරාගනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති සාමණේර හිමිවරුන්ය.

i. 2010 ජනවාරි 01 දින සිට 2013 වෙසක් සතියෙහි අවසාන දිනය දක්වාවූ කාලය තුළ පැවිදි කළ සාමණේර හිමිනමක් විය යුතුය.

ii. වයස අවුරුදු 18 ට අඩු විය යුතුය.

iii. පැවිදි වී මාස 3 ක් ගත වී තිබිය යුතුය.

iv. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සාමණේර ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

v. එක් විහාරස්ථානයකින් උපරිම දස නමකි.

vi. 2014 සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සියලු භික්ෂූන් වහන්සේලා මෙම ශිෂ්‍යාධාර ක්‍රමයට දායක කර ගැනීමට අපේක්ෂා කෙරේ.

සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා වන සාමණේර කැපකරු ශිෂ්‍යාධාර යටතේ 2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා රු 700 බැගින් ස්වාමීන්වහන්සේලා 669 කට ගෙවීම් කිරීමට කටයුතු කර ඇති අතර මෙම වසරේදී ලබා දී ඇති මුදල 5,855,853.50/= කි. මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් තැපැල් කාර්යාල හරහා සිදු කෙරෙන බැවින් මෙම මුදලට තැපැල් කාර්යාල සඳහා වන කොමිස් මුදලක් ද ඇතුළත් වී ඇත.

## 4.5 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා වැඩ සිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ලෙස මෙය ක්‍රියාත්මක කෙරේ. 2559 වෙනි වෛශ්‍යාක්‍ය මංගල්‍ය නිමිති කොටගෙන දිවයින පුරා වැඩ සිටින අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබන භික්ෂූන් වහන්සේලාට වෛද්‍ය පහසුකම් සඳහා ආධාර ලබා දීම මෙයට අදාළ වේ.

මෙහිදි දිවයින පුරා වැඩසිටින සුදුසුකම් ලත් භික්ෂූන් වහන්සේලා අතුරින් ප්‍රාදේශීය ලේකම් හා ශාසනාරකෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන්ගේ නිර්දේශයන්ද වෛද්‍ය නිර්දේශයන්ද මත භික්ෂූන් වහන්සේලා වෙත වෛද්‍යාධාර ලෙස මසකට රු. 5000/= ක මුදලක් ගෙවීම සිදුවේ.

## 2017 වසරේ දී මූල්‍යාධාර ලබා දුන් ස්වාමීන්වහන්සේලා පිළිබඳ තොරතුරු

| අනු අංකය | ස්වාමීන් වහන්සේ/දස සිල් මාතාවගේ නම | රෝගය |
|---|---|---|
| 1 | පූජ්‍ය ඩබ් විමලබුද්ධි හිමි | අංශභාගය |
| 2 | පූජ්‍ය ඩබ් සුසීම හිමි | අධිරුධිර පීඩනය හා ඇදුම |
| 3 | පූජ්‍ය පී. ජයශාන්ත හිමි | ස්නායු දුර්වලතා |
| 4 | පූජ්‍ය බී නාරද හිමි | වකුගඩුවක් හා අක්මාවේ කොටස දන්දී ඇති බැවින් ජීවිතාන්තය දක්වා වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වේ. |
| 5 | පූජ්‍ය ඒ බුද්ධසාර හිමි | අරන්තලාව භික්ෂු ඝාතනයෙන් ආබාධිත වී ඇත. |
| 6 | පූජ්‍ය ඒ විජිතසිරි හිමි | ඉනෙන් පහල ප්‍රදේශය පණ නැත. |
| 7 | පූජ්‍ය ඩී පුඤ්ඤරතන හිමි | අංශභාගය |
| 8 | පූජ්‍ය ඩී ජිනානන්ද හිමි | දියවැඩියාව |
| 9 | පූජ්‍ය වී ධම්මරක්ඛිත හිමි | වකුගඩු රෝග |
| 10 | පූජ්‍ය ආර් ඥානසිංහ හිමි | වකුගඩු රෝග |
| 11 | පූජ්‍ය ජේ ධම්මපාලී සිල්මැණියෝ | ඇදුම රෝග |
| 12 | පූජ්‍ය එස් සුමේධ හිමි | හෘද රෝග |
| 13 | පූජ්‍ය ඒ විමලරතන හිමි | වකුගඩු රෝගය (මේ සඳහා රජයෙන් රු.3000/- ලබා දෙන බව ප්‍රා.ලේ සඳහන් කර ඇත) |
| 14 | පූජ්‍ය එම් රතනපාල හිමි | සැත්කමක්ද කර ඇත, හෘදයාබාද |
| 15 | පූජ්‍ය යූ. දේවමිත්ත හිමි | හෘද අකර්මන්‍යතා |
| 16 | පූජ්‍ය එම් ධම්මජෝති හිමි | ශරීරයේ දකුණුඇලය අකර්මන්‍ය වීම |
| 17 | පූජ්‍ය ඩී සීලානන්ද හිමි | පෙනහල්ලේ රෝග |
| 18 | පූජ්‍ය ජී දම්මසිරි හිමි | අසපීදිරා යාම |
| 19 | පූජ්‍ය පී ඥානරතන හිමි | වකුගඩු රෝග |
| 20 | පූජ්‍ය ඒ දමිත හිමි | වකුගඩු රෝග |
| 21 | පූජ්‍ය ඒ සද්ධානන්ද හිමි | හෘදයාබාද |
| 22 | පූජ්‍ය එම් රතනසාර හිමි | ශරීරයේ එක් අංශයක් අප්‍රාණික වීම |
| 23 | පූජ්‍ය ජී ධම්මාලෝක හිමි | වකුගඩු රෝග |
| 24 | පූජ්‍ය ඩබ් බක්කුල හිමි | ගින්නට වැටී පිළිස්සීම |
| 25 | පූජ්‍ය ජී ශාන්තරතන හිමි | අධිරුධිර පීඩනය හා වෙනත් රෝග |
| 26 | පූජ්‍ය යූ. සුගතඥාන හිමි | අවුරුදු 15 සිට හදවත් රෝග සහ හතිය |
| 27 | පූජ්‍ය එම් බී අමරවංශ හිමි | වකුගඩුවේ ගල් සෑදීම |
| 28 | පූජ්‍ය එම් පුඤ්ඤසාර හිමි | ඔස්ටියෝ පොරෝසිස් |
| 29 | පූජ්‍ය ජී ලංකානන්ද හිමි | වකුගඩු රෝග |
| 30 | පූජ්‍ය පී ධම්මින්ද හිමි | තයිරොයිඩ් ග්‍රන්ථයේ ඉදිමීම, දියවැඩියාව |
| 31 | පූජ්‍ය එම් ඤාණරතන හිමි | රුධිර පීඩනය, වකුගඩු රෝග |

මෙම වසරේ දී ස්වාමීන්වහන්සේලා 31 නමක් වෙනුවෙන් රුපියල් 1645000/- ක මූල්‍යාධාර ලබා දීම සිදු කර ඇත.




### 4.6 වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගිකව පුහුණුව ලබා දීම

වයස්ගතව පැවිදි ජීවිතයට ඇතුලත්වන ස්වාමීන්වහන්සේලා වැඩි වෙමින් පවතින ප්‍රවනතාවයක් තුළ එවැනි හිමිවරු පැවිදි ජීවිතය පිළිබඳව මනා අවබෝධයකින් තොරව හැසිරෙන බැවින් එම තත්වය බෞද්ධ සැදැහැවතුන්ගේ කලකිරීමටත් විවේචනයටත් භාජනය වූ අවස්ථා තිබේ. එසේම ශාසනයට අහිතකර බොහෝ දෑ කිරීමට පෙළඹීම නිසා සමාජ දෝෂ දර්ශනයට ලක්වන අවස්ථා දැකිය හැකි වේ. මේ අනුව එවැනි හිමිවරුන්ට පැවිදි ජීවිතයේ ඇති උත්තරීතර භාවය හා ගිහි පැවිදි වෙනස පිළිබඳව මා මූලික වත් පිළිවෙත් හා ධර්මානුකූල දැනුමක් ද ලබාදීමට මෙම වැඩමුළු පැවැත්වේ.

දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රාදේශීය ලේකම් මඟින් අදාල බල ප්‍රදේශයේ විහාරස්ථානවල වැඩ සිටින ළමාවිය ඉක්මවා පැවිදි වූ භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු කැඳවා ගනු ලබයි. ලැබෙන තොරතුරු මත තෙදින වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කරනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්ගේ සහය ලබාගෙන උක්ත වැඩසටහන අදාල දිස්ත්‍රික්කය තුළදී සංවිධානය කරනු ලබන අතර, එක් වැඩසටහනත් සඳහා අවම භික්ෂූන් වහන්සේලා 10 නමක් අපේක්ෂා කෙරේ.





## 2017 වර්ෂයේ පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර

| දිස්ත්‍රික්කය | කුරුණෑගල |
|---|---|
| ස්ථානය | වාරියපොල බමුණාකොටුව ඉසිපතනාරාම විහාරස්ථානය |
| සම්බන්ධීකරණය | බුද්ධශාසන අරමුදලේ කාර්යාලය හා රාමඤ්ඤ මහා නිකායේ සමාජ සංවර්ධන ලේඛකාධිකාරි ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත කරකොලේ පියදස්සී නායක ස්වාමින්වහන්සේ |
| මෙහෙයවීම | රාජකීය පණ්ඩිත කරකොලේ පියදස්සී නායක ස්වාමින්වහන්සේ |
| දින ගණන | 03 |
| සහභාගී වූ හිමිවරු සංඛ්‍යාව | 14 |
| මෙම වැඩසටහන සඳහා වැය වූ මුදල | රු.112,418.76 |

# 05. ඉදිරි ඉලක්ක

## 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | 2018 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක |
|---|---|---|
| 1. | සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබා දීම | • සාමණේර ආයතන 20 ක් ලියාපදිංචි කිරීම හා මූල්‍යාධාර ලබා දීම |
| 2. | සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය | • සාමණේර හිමිවරු 1350 නමක් සඳහා |
| 3. | දිවයින පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ලබා දීම | • කෙටි කාලීන රෝග සහ දිගු කාලීන රෝග සඳහා මුදල් වෙන් කිරීමේදී රෝගයේ ස්වභාවය අනුව රු.3000/- මුදලක්ද, ශල්‍යකර්ම හා ආසාධ්‍ය රෝග සඳහා ද, රු.5000/- බැගින් ජීවිත කාලයටම මූල්‍යාධාර ගෙවීම. |
| 4 | වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම. | • වැඩමුළු 8 ක් පැවැත්වීම. |
| 5 | දිවයින පුරා පිහිටි දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක ලබාදීමේ ව්‍යාපෘතිය | • 2018 වර්ෂයේ සනීපාරක්ෂක පහසුකම් 30 ක් ලබාදීම. |

# 06. මූල්‍ය කළමණාකරණය

## බුද්ධශාසන අරමුදල
## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### 6.1 ආදායම් වියදම් ගිණුම

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. ශ | රු. ශ |
| **ආදායම්** | | | |
| ආයෝජන ආදායම | 5 | 51,836,069.22 | 34,748,961.49 |
| ධර්ම ග්‍රන්ථ අලෙවියෙන් ලාභ | 6 | 211,843.77 | 214,798.62 |
| පරිත්‍යාග සහ වෙනත් ආදායම් | 4 | 11,000.00 | 74,675.57 |
| **මුළු ආදායම් එකතුව** | | 52,058,912.99 | 35,038,435.68 |
| **අඩුකළා : ව්‍යාපෘති වියදම්** | | | |
| සාමණේර ආයතන ආධාර | | 1,365,000.00 | 1,015,000.00 |
| සාමණේර ආයතන - අධීක්ෂණ වියදම් | | 40,703.00 | 14,245.00 |
| සාමණේර කැපකරු දායක වාරික මුදල් | | 5,855,853.50 | 4,454,026.50 |
| භික්ෂු වෛද්‍යාධාර | | 1,645,000.00 | 260,800.00 |
| සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර | | - | 2,100,000.00 |
| උඩුදුම්බර වෙක්පත් බෙදාදීම වියදම් | | - | 138,000.00 |
| දානමය පිරිකර සඳහා ග්‍රන්ථ පරිත්‍යාග | | - | - |
| සාමණේර ආයතන විභාග | | 754,304.00 | 8,350.00 |
| වැඩිහිටි භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහනට වියදම් | | 112,418.76 | 341,139.00 |
| **පරිපාලන වියදම්** | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | | 24,905.00 | 24,866.00 |
| පාලක මණ්ඩල පාරිශ්‍රමික දීමනා හා කාර්ය මණ්ඩල වැ | | 16,819.00 | 342,032.27 |
| ගමන් වියදම් | | 38,870.00 | 52,082.00 |
| පරිගණක පුහුණු දීමනා | | 151,500.00 | 218,000.00 |
| උපයන විට ගෙවූ බදු | | | |
| අතිකාල | | 17,112.00 | 14,694.00 |
| සංග්‍රහ වියදම් | | 11,571.00 | 15,980.00 |
| වියදම් | | | 67,566.00 |
| **විවිධ ක්ෂය වෙන්කිරීම්** | | | |
| සේප්පුව | | 4,310.00 | 4,310.00 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | | 87,500.00 | 87,500.00 |
| ලී බඩු උපකරණ ක්ෂය | | 5,775.00 | 5,775.00 |
| ශබ්ද විකාශන යන්ත්‍රය | | 5,735.00 | 5,735.00 |
| උපකරණ සහ සවි කිරීම් | | 16,294.00 | 16,294.00 |

| | | |
|---|---|---|
| වියදම්වල එකතුව | 10,153,670.26 | 9,186,394.50 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | 41,905,242.73 | 25,852,041.18 |

# බුද්ධශාසන අරමුදල

6.2

## 2017-12-31 දිනට ශේෂ පිරික්සුම

| | | හර | බැර |
|---|---|---|---|
| | | රු ශ | රු ශ |
| සේප්පුව | | 57,456.00 | |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | | 57,750.00 | |
| සවි කිරීම් හා කාර්යාල උපකරණ | | 162,940.00 | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් | | 180,400,000.00 | |
| ආයෝජන ලංකා බැංකුව | | 30,843,158.67 | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කැපකරු දායක ව්‍යාපෘතිය යටතේ | | 39,770,000.00 | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමණේර ආයතන ව්‍යාපෘතිය | | 30,583,224.22 | |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය (ලංකා බැංකුව) | | 87,996,550.60 | |
| මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් | | 111,673,805.48 | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෛද්‍යාධාර ව්‍යාපෘතිය | | 15,000,000.00 | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 01125 ඉතිරි කිරීමේ ගිණුම | | 6,940,331.41 | |
| ශබ්ද විකාශන යන්ත්‍රය | | 45,885.00 | |
| ඉඩම් | | 7,000,000.00 | |
| Anuradapura ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් | | 3,500,000.00 | |
| බුද්ධ ජයන්ති කාසි තොගය | | 317,400.00 | |
| විවිධ බෞද්ධ ග්‍රන්ථ | | 1,094,626.49 | |
| පාලි ටීකා සිංහල පරිවර්තන | | 3,787,873.88 | |
| 2600 Years of Buddhism ග්‍රන්ථය | | 5,490,240.00 | |
| Cost of Book Sales | | 1,232,607.23 | |
| නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පොත් විකුණුම් | | 7,988,635.88 | |
| පාලි ටීකා ඉංග්‍රීසි පරිවර්ථනය සඳහා නැදිමාල බෞද්ධ | | 1,080,165.00 | |
| විකුණුම් සඳහා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඇති පොත් | | 3,955,745.33 | |
| ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී | | 2,283,213.33 | |
| ලැබිය යුතු ජාතික ඉතිරි කිරීමේ බැංකු පොලිය | | 10,020,186.29 | |
| SAMANERA KAPAKAURU PROJECT INTEREST | | | 3,986,316.19 |
| සාමණේර ආයතන ව්‍යාපෘති ලැබිය යුතු පොලී | | 3,944,722.87 | |
| ජාතික ඉතිරි කිරිම ඍජු තැන්පත් ලැ/යු පෙලී | | 0.00 | |
| ජා.ඉ.බැංකුව - වෛද්‍යාධාර ස්ථාවර තැන්පතු ලැබිය යුතු පොලී | | 479,178.08 | |
| මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් ලැබිය යුතු පොලී | | 9,079,414.63 | |
| SAMANERA AYATHANA PROJECTINTEREST R ECEIVED | | | 3,171,238.52 |
| රාජකීය ආසියාතික සංගමය | | 7,282.00 | |
| recievabal tax reduce on NSB Interest | | 659,667.96 | |
| Advance | | 0.00 | |
| Central Bank | | 22,932,752.12 | |
| Bank of ceylon | | 395,110.20 | |
| ගෙවිය යුතු සාමණේර ආයතන දීමනා | | | 240,000.00 |
| ගෙවිය යුතු සාමණේර කැපකරු ශිෂ්‍යාධාර | | | 0.00 |
| පාලි ටීකා සඳහා නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයට | | | 544,409.50 |
| 2600 Years of Buddhism පොත සඳහා ලිපි සැපයීම වෙනුවෙන් | | | 1,168,025.00 |
| සුනාමි ආධාර | | | 1,348,796.00 |
| බුද්ධශාසන අරමුදල | | | 538,277,994.06 |

| | | | |
|---|---|---|---|
| NSB ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873 Interest | | | 29,983.94 |
| NSB ඉතිරි කිරීමේ ගිණුම් අංක 100010101125 Interest | | | 241,295.83 |
| NSB ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873 | | 747,224.72 | |
| සාමණේර කැපකරු ශිෂ්‍යාධාර ගෙවීම් | | 5,855,853.50 | |
| සාමණේර ආයතන ගෙවීම් | | 1,365,000.00 | |
| භික්ෂු වෛද්‍යාධාර ගෙවීම් | | 1,645,000.00 | |
| ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් | | 7,330.00 | |
| සාමණේර ආයතන විභාග ගිණුම | | 754,304.00 | |
| WADIHITI BIKSHU PROMOTION PROGRAMME | | 112,418.76 | |
| ගොඩනැගිලි සමුච්චිත ක්ෂය | | | 350,000.00 |
| සේප්පුව සමුච්චිත ක්ෂය වෙන්කිරීම | | | 30,170.00 |
| ලී බඩු හා කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය | | | 23,100.00 |
| ශබ්ද විකාශන යන්ත්‍ර සමුච්චිත ක්ෂය | | | 22,940.00 |
| සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය වෙන්කිරීම | | | 65,176.00 |
| ගොඩනැගිලි ක්ෂය | | 87,500.00 | |
| සේප්පුව ක්ෂය | | 4,310.00 | |
| ලී බඩු හා කාර්යාල උපකරණ ක්ෂය | | 5,775.00 | |
| ශබ්ද විකාශන යන්ත්‍ර ක්ෂය | | 5,735.00 | |
| සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය | | 16,294.00 | |
| ජා ඉ බැ සෘජු තැන්පත් පොලී | | | 19,847,251.35 |
| ලං බැ භාන්ඩාගාර බිල්පත් පොලී | | | 8,205,709.30 |
| BOC Interest | | | 3,074,877.11 |
| Peoples Bank Interest | | | 11,629,396.98 |
| වෛද්‍ය ආධාර | | | 1,650,000.00 |
| පොත් අලෙවි ආදායම | | | 1,444,451.00 |
| පරිත්‍යාග | | | 6,472,266.18 |
| පරිත්‍යාග Received | | | 110,000.00 |
| පරිත්‍යාග Release | | 99,000.00 | |
| සාමනේර ආයතන අධීක්ෂණ මණ්ඩල දීමනා | | 40,703.00 | |
| සංග්‍රහ වියදම් | | 11,571.00 | |
| වෙනත් වියදම් | | 0.00 | |
| ගමන් වියදම් | | 38,870.00 | |
| ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් | | 17,575.00 | |
| පරිගණක දීමනා | | 151,500.00 | |
| Vehicle Repair | | 0.00 | |
| Fuel for 300-3812 | | 0.00 | |
| අතිකාල දීමනා | | 17,112.00 | |
| පාලක මණ්ඩල වියදම් | | 16,819.00 | |
| NSB KAPAKARU LABIYA YUTHU POLI | | 734,173.15 | |
| LANKA BANKU LABIYA YUTHU POLI | | 1,419,406.16 | |
| එකතුව | | | |
| | | 601,933,396.96 | 601,933,396.96 |

# බුද්ධශාසන අරමුදල

## 6.3 2017.12.31 දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. ශ | රු. ශ |
| **වත්කම්** | | | |
| ස්ථාවර වත්කම් | 1 | 10,332,645.00 | 10,452,259.00 |
| ආයෝජන | 2 | 503,954,295.10 | 483,767,199.59 |
| ශුද්ධ ජංගම වත්කම් | 3 | 73,717,358.87 | 59,879,597.65 |
| | | **588,004,298.97** | **554,099,056.24** |
| **මෙයින් නියෝජනය වන්නේ;** | | | |
| බුද්ධශාසන අරමුදල | | 580,183,236.79 | 538,277,994.06 |
| විවිධ පරිත්‍යාග | 4 | 6,472,266.18 | 14,472,266.18 |
| සුනාමි ආධාර | | 1,348,796.00 | 1,348,796.00 |
| | | **588,004,298.97** | **554,099,056.24** |

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම සඳහා බුද්ධශාසන අරමුදලේ ඉදිරියේ රැස්වනු ලබන පළමු පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

බුද්ධ ශාසන අරමුදලේ 2017.12.31 දිනට ඉදිරිපත් කර ඇති ශේෂ පත්‍රය සහ ගිණුම් ප්‍රකාශන සම්බන්ධ වගකීම බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය සතු වන්නේය.

ඒ.එන් මුණවීර
ගණකාධිකාරී
බුද්ධශාසන අරමුදල

ගණකාධිකාරී,
බුද්ධශාසන අරමුදල
"දහම්පාය",
අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07

ඩබ්.ටී.එච්. රුචිර විතාන
ලේකම්
බුද්ධශාසන අරමුදල

ඩබ්. ටී. එච්. රුචිර විතාන
ලේකම් (පූජා භූමි හා බෞද්ධ කටයුතු)
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
"දහම්පාය",
135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07

මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන අමාත්‍යාංශය
බුද්ධශාසන අරමුදලේ
පාලකමණ්ඩල සාමාජික

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
135, "දහම්පාය",
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

ජී.බී. කරවිට
මහාභාරකාර තැන
බුද්ධශාසන අරමුදලේ
පාලකමණ්ඩල සාමාජික

ජී. බී. කරවිට (එල්එල්.බී)
නීතිඥ
මහා භාරකාර තැන (රා.ආ.)
මහා භාරකාර දෙපාර්තමේන්තුව

6.4

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. සීඒඑස්/ඩී/බීඑස්එෆ්/01/2017/එෆ්ඩී
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 ඔක්තෝබර් 26 දින

බුද්ධශාසන අරමුදල 01 NOV 2021 BUDDHASASANA FUND

ලේකම්

බුද්ධශාසන අරමුදල

**බුද්ධශාසන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

ACC
DO (Acc) / MA (N)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීඑස්/ඩී/බීඑස්එෆ්/01/ 2017/එෆ්ෆ් | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2021 ඔක්තෝබර් 26 දින |

ලේකම්
බුද්ධශාසන අරමුදල

**බුද්ධශාසන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

බුද්ධශාසන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරණු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි ඉදිරිපත් කර නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 10,372,740 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ආ) සුනාමි ආධාර | 1,348,796 | විස්තරාත්මක තොරතුරු |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 396 | 2013 සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී අරමුදල විසින් නිකුත් කරන ලද එකතුව රු.59,363 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 502 (2) | අරමුදල සතු රු. 10,332,645 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**2.4.1 ලැබිය යුතු මුදල්**

වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.13,031,828 ක් වූ අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු ශේෂයෙන් රු.1,087,447 ක් වර්ෂ 05 කට සහ රු. 11,944,381 ක් වර්ෂ 02 කට වඩා පැරණි ශේෂයන් (පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව) වූ අතර, එම ශේෂ අය කර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

**2.4.2 ගෙවිය යුතු මුදල්**

වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂයෙන් රු.544,409 ක් වර්ෂ 03 කට සහ රු.1,168,025 ක් වර්ෂ 02 කට වඩා පැරණි ශේෂය (පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව) වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයරු.41,905,243 ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,852,041 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,053,202 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම රු.17,087,108 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජන පොලී සහ වෙනත් ආදායම් වශයෙන් රු.52,058,913 ක් ලැබී තිබුණ ද එයින් රු.10,153,670 ක් එනම් සියයට 19 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම රු.503,954,295 ක් විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදල මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සඳහා රු. 47,910,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද, ව්‍යාපෘති සඳහා වැය කර තිබූ මුදල රු. 9,773,279 ක් පමණක් විය. ඒ අතුරින් දුෂ්කර විහාරස්ථාන සඳහා සංඝාවාස ඉදි කිරීම සහ දුෂ්කර විහාරස්ථාන වෙනුවෙන් සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා ඇස්තමේන්තු ගත කර තිබූ මුදල පිළිවෙලින් රු.10,000,000 ක් සහ රු.5,000,000 ක් වුවද එම ව්‍යාපෘති වෙනුවෙන් කිසිදු මුදලක් යෙදවීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ 02 මාස 07 ක කාල පමාවකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ජර්නල් වවුචර් ඉදිරිපත් කිරීම

(ආ) අරමුණු අනුව කාර්යසාධන මට්ටම

(ඇ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ

(ඈ) අරමුදල් ආයෝජනය හා උපයෝජනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

5